# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුව දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය වේ. විශිෂ්ට නායකත්ව ගුණාංගයන්ගෙන් හෙබි, ප්‍රතිඵල අරමුණු කර ගත් කාර්යය ප්‍රවේශයකින් යුතු, කැපවීමක් ඇති සහ කණ්ඩායම් හැඟීමකින් වැඩ කිරීමේ කැමැත්ත ඇති පළපුරුදු වෘත්තිකයන් මහ බැංකුවට අවශ්‍යව ඇත.

## ජ්‍යෙෂ්ඨ විධායක - තාක්ෂණික අවදානම් අධීක්ෂණ තනතුර
## (කොන්ත්‍රාත් පදනම මත)

**කාර්යය/වගකීම් :**

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතනවල තොරතුරු සුරක්ෂිතතාව, තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ එතැන් හා විතැන් අධීක්ෂණය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන විසින් තොරතුරු ආරක්ෂණ, තාක්ෂණ අවදානම් කළමනාකරණය, මෙහෙයුම් අවදානම් කළමනාකරණය සහ නව තාක්ෂණයන් භාවිතා කිරීම පිළිබඳ රෙගුලාසි, මාර්ගෝපදේශ සහ අධීක්ෂණ රාමු සකස් කිරීම හා සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන අංශවල අධීක්ෂණ තාක්ෂණය (SupTech) සහ නියාමන තාක්ෂණය (RegTech) සංකල්පනය කිරීම හා ක්‍රියාත්මක කිරීමට දායක වීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන හා අංශවල තොරතුරු සුරක්ෂිතතාව, තාක්ෂණික අවදානම් කළමනාකරණය, මෙහෙයුම් අවදානම් කළමනාකරණය සහ නව තාක්ෂණයන් භාවිතය නියාමනය හා අධීක්ෂණයට අදාළ පාර්ශ්වකරුවන්ගේ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම
- ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පාර්ශ්වකරුවන්ට පුහුණුවීම් හා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම

**අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:**

- **අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්:**

  ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, පරිගණක විද්‍යාව (Computer Science), තොරතුරු තාක්ෂණය (Information Technology) හෝ තොරතුරු/සයිබර් සුරක්ෂිතතාව (Information/Cyber Security) යන විශේෂ උපාධි අතරින් එක් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතු ය.) හෝ පරිගණක විද්‍යාව (Computer Science), තොරතුරු තාක්ෂණය (Information Technology), තොරතුරු/සයිබර් සුරක්ෂිතතාව (Information/Cyber Security) පිළිබඳ ශාස්ත්‍රපති හෝ ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් (අවම වශයෙන් වසරක) **සහ** පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් සම්පූර්ණ කර තිබීම;

  - ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ බැංකු (Banking), අවදානම් කළමනාකරණය (Risk Management), මූල්‍ය (Finance), ගිණුම්කරණය (Accounting), ආයුගණක විද්‍යාව (Actuarial Science) හෝ ව්‍යාපාර පරිපාලනය (Business Administration) පිළිබඳ උපාධියක් (අවම වශයෙන් වසර 03 ක) හෝ පශ්චාත් උපාධියක් (අවම වශයෙන් වසරක ශාස්ත්‍රපති හෝ ඉහළ මට්ටමේ)
  - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CA Sri Lanka) ආශ්‍රිත සාමාජිකයෙකු වීම
  - එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CIMA-UK) ආශ්‍රිත සාමාජිකයෙකු වීම
  - වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකයෙකු වීම
  - ඇමරිකා එක්සත් ජනපදයේ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයෙකු වීම (Charter Holder of CFA-USA)
  - ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CMA-SL) ආශ්‍රිත සාමාජිකයෙකු වීම
  - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ආශ්‍රිත සාමාජිකයෙකු වීම
  - ඇමරිකා එක්සත් ජනපදයේ ආයුගණක සංගමයේ (Society of Actuaries) සාමාජිකයෙකු වීම
  - වරලත් ව්‍යවසාය අවදානම් විශ්ලේෂකයෙකු වීම (Chartered Enterprise Risk Analyst)
- **පළපුරුද්ද :** අදාළ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනයක පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු සුරක්ෂිතතාව ආශ්‍රිත උපදේශන, ඉංජිනේරු, විගණන හෝ අවදානම් කළමනාකරණ තනතුරක අවම වශයෙන් අවුරුදු පහ (05) ක පළපුරුද්ද
- **වයස :** 2020 දෙසැම්බර් 21 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.
- **සේවා නියුක්තිය :** කොන්ත්‍රාත් පදනම මත වසර තුන (03) ක් සඳහා
- **වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ** : රු. 350,000 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාවක් සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය

## ජ්‍යෙෂ්ඨ විධායක - භාණ්ඩාගාර මෙහෙයුම් අධීක්ෂණ තනතුර
## (කොන්ත්‍රාත් පදනම මත)

**කාර්යය/වගකීම් :**

- පරීක්ෂණ සැලැස්මට (Examination Plan) අනුව භාණ්ඩාගාර ගනුදෙනු, අභ්‍යන්තර පාලනයන්, නියාමන අවශ්‍යතා, භාණ්ඩාගාර පද්ධති සහ වෙළඳපල හැසිරීම ඇතුළු බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර මෙහෙයුම් පරීක්ෂා කිරීම
- අවශ්‍ය විට දී භාණ්ඩාගාර මෙහෙයුම් සහ/හෝ ඒ හා සම්බන්ධ කටයුතු සඳහා ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම
- තීරණ ගැනීම, වෙනත් දෙපාර්තමේන්තු, බාහිර පාර්ශවයන්, බලපත්‍රලාභී බැංකු විසින් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, කර්මාන්ත නිරාවරණය විශ්ලේෂණය කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ භාණ්ඩාගාර මෙහෙයුම්වලට අදාළව පවරා ඇති වෙනත් කාර්යයන් සඳහා විශේෂඥ දැනුම ලබා දීම/සහාය දීම
- අවශ්‍යය අවස්ථාවන්හි දී ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා පවරා ඇති කණ්ඩායම සමඟ සම්බන්ධීකරණය කිරීම සහ පවරා ඇති කාර්යයන් ඵලදායි ලෙස සම්පූර්ණ කිරීමට කණ්ඩායම් සාමාජිකයින්ට මඟ පෙන්වීම

**අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:**

- **අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්:**

  ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, ගණකාධිකරණය (Accountancy)/මූල්‍ය (Finance)/මූල්‍ය කළමනාකරණය (Financial Management)/ව්‍යාපාර පරිපාලනය (Business Administration)/රාජ්‍ය පරිපාලනය (Public Administration)/වාණිජ්‍යය (Commerce) යන විශේෂ උපාධි අතරින් එක් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතු ය.) **සහ** පහත සඳහන් කුමන හෝ සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම;

  - මූල්‍ය වෙළඳපොල සංගමයෙන් (ACI-FMA) ලබාගත් ගනුදෙනු/මෙහෙයුම් සහතිකය හෝ ඩිප්ලෝමා පාඨමාලාව
  - ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයෙන් ලබාගත් භාණ්ඩාගාර හා විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සහතිකය
  - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් (IBSL) ලබාගත් භාණ්ඩාගාර හා අවදානම් කළමනාකරණ ඩිප්ලෝමාව
  - ඇමරිකා එක්සත් ජනපදයේ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයෙකු වීම (Charter Holder of CFA-USA)
  - අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමයෙන් (Global Association of Risk Professionals) ලබාගත් මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳ සුදුසුකම
- **පළපුරුද්ද :** අදාළ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් මූල්‍ය ආයතනයක ඉදිරි කාර්යාල භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු වල අවම වශයෙන් වසර අට (08) ක පළපුරුද්ද
- **වයස :** 2020 දෙසැම්බර් 21 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.
- **සේවා නියුක්තිය :** කොන්ත්‍රාත් පදනම මත වසර තුනක් (03) සඳහා
- **වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ** : රු. 350,000 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාවක් සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය

අයදුම්පත සමඟ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතු ය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකකින් හෝ කිහිපයක් මගින්

### අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, **www.cbsl.gov.lk** යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

නියමිත ආකෘතියට අනුව සැකසූ, සියලු ලිපිලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ සියලු ලිපිලේඛන සහිතව එම අයදුම්පත්වල පරිලෝකනය කරන ලද (Scanned) පිටපත් **hrd_recruitment@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට, **2020 දෙසැම්බර් 21 දින හෝ ඊට පෙර** යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී "ජ්‍යෙෂ්ඨ විධායක-තාක්ෂණික අවදානම් අධීක්ෂණ තනතුර (කොන්ත්‍රාත් පදනම මත)/ජ්‍යෙෂ්ඨ විධායක-භාණ්ඩාගාර මෙහෙයුම් අධීක්ෂණ තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂය යටතේ හෝ අදාළ පරිදි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතියෙන් බැහැර වූ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල්පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුරු සඳහා පත් කර ගනු නොලබයි.

තෝරා ගැනීම සඳහා කුමන හෝ ආකාරයකින් බලපෑම් කිරීම, හෝ එසේ කිරීමට තැත් කිරීම තෝරා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළ බව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළ බව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.


**අධ්‍යක්ෂ-මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 011 - 2477330 ෆැක්ස් : 011 - 2477715**